පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය

වෙළුම 5, අංක 1 2000 ජූලි-අගෝස්තු

## බීජී 369 - මාස 3 1/2 වයස් කාණ්ඩයේ නව වී ප්‍රභේදයක්

මෙම ප්‍රභේදය පහතරට තෙත් කලාපය හා මැදරට තෙත් කලාපයේ වගා කිරීම සඳහා නිර්දේශ කර ඇත.

පහතරට හා මැදරට තෙත් කලාප තුළ වාර්ෂික වී වගා වපසරියෙන් 70 - 80% ක් වගා කෙරෙනුයේ කෙටිකාලීන වයස් කාණ්ඩයට අයත් වී ප්‍රභේද වේ. වැඩි අස්වනු ලබාදෙන අඩු වයස් වී ප්‍රභේද බොහොමයක් තිබෙන බැවින් අස්වනු වැඩිවීමක් අපේක්ෂා කළද තෙත් කලාපයේ සමහර ප්‍රදේශ වල වී අස්වැන්න එකම මට්ටමක පවතින බව පෙනේ. මෙලෙස අඩු නිෂ්පාදන ධාරිතාවයට එක් හේතුවක් විය හැක්කේ එම වී ප්‍රභේද තෙත් කලාපයේ පවතින විවිධ දේශගුණ තත්ව වලට අනුවර්තනය නොවීම විය හැකිය.

බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් හඳුන්වාදුන් මෙම නව නිර්දේශිත බීජී 369 ප්‍රභේදය මැදරට හා පහතරට තෙත් කලාපයේ පවතින පරිසර තත්ව සහ ජෛව හා අජෛව තත්වයන්ට විශේෂිත ලෙස අනුවර්තනය පෙන්වයි.

මෙම ප්‍රභේදය ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන ගොප් මැස්සා ජෛව දර්ශ I හා II යන දෙකටම ප්‍රතිරෝධී වේ. ගොප් මැස්සා හානිය විශේෂයෙන් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වගාවන්ට ආර්ථිකව හානිදායී ලෙස බලපාන පළිබෝධ හානියක් වේ. රසායනික ක්‍රම මගින් එනම් කෘමිනාශක භාවිතයෙන් මෙම පලිබෝධකයා පාලනය සඳහා මිලියන 60 ක් පමණ වාර්ෂිකව වැයවන නමුත් මෙම ක්‍රම මගින් ද හානිය පාලනය වනුයේ 60% ක් පමණි. මේ නිසා මෙම පලිබෝධකයා සඳහා වඩා වැදගත් වනුයේ ප්‍රතිරෝධී ප්‍රභේද භාවිතය පමණි. මෙම නව වී ප්‍රභේදය එම අවශ්‍යතා සපුරා ඇත. තවද මෙය කොළ පාලුව රෝගී තත්වය සඳහා ද ප්‍රතිරෝධී වේ. දුඹුරු පැල කීඩෑවා, කොළ කීඩෑවා බැක්ටීරියා පත්‍ර අංගමාරය සඳහා මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී වන අතර, යකඩ විෂ වීමට මධ්‍යස්ථ ලෙස ඔරොත්තු දේ. එම නිසා මෙම ප්‍රභේදය දැනට තෙත් කලාපයේ බහුලව වගා කරන බීජී 94-1, බීජී. 352 සහ බීඩබ්. 267-3 ප්‍රභේද වලට වඩා උසස් ලක්ෂණ වලින් යුතු වේ.

තරමක රවුම්, දිගටි ආකාර සුදු සහලින් යුතු ප්‍රභේදයකි. නොපාහින ලද සහල් ප්‍රතිශතය 79.9 ක් පමණ වන අතර නොකැඩුනු සහල් ප්‍රතිශතය 69.3 ක් වේ. වී බුසලකින් සහල් කි.ග්‍රෑ. 22 ක් එනම් එම වයස් කාණ්ඩයට අයත් අනෙකුත් ප්‍රභේද වලට වඩා වැඩි සහල් ප්‍රමාණයක් ලබාගත හැකිය.

මෙම ප්‍රභේදය සඳහා පොහොර නිර්දේශය හා ශෂ්‍ය ක්‍රම, මාස 3 1/2 වයස් කාන්ඩයට අයත් අනෙකුත් වී ප්‍රභේද හා සමාන වේ. වල් මර්ධනය, ගැඹුරු බිම් සැකසීම සමග කාබනික පොහොර භාවිතය හා නිර්දේශිත රසායනික පොහොර භාවිත කිරීම වැනි පාලන තත්ව යටතේ අක්කරයකට බුසල් 130 ට වඩා ලබාගත හැකිවේ. කෙසේ නමුත් වැඩිපුර නයිට්‍රජන් පොහොර (යූරියා) භාවිතය එතරම් සුදුසු නොවේ.

***මූලාශ්‍රය : ආචාර්ය ආර්.එම්. රාජපක්ෂ, පර්යේෂණ නිලධාරී, පැලෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, ගන්නොරුව.***

## තායි කංකුන්

අයිපෝමියා ඇක්වටිකා (Ipomea acquatica) නම් උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන කංකුන්, දිය නිවිතිය (water spinach) ලෙස ද ව්‍යවහාර වේ. කොළ එළවළුවක් ලෙස වැදගත් තැනක් ගනී.

මෙම තායි කංකුන් ප්‍රභේදය තායි බැම්බුලීෆ් කංකුන් ලෙස ද හඳුන්වයි. උණ බම්බු ශාකයේ කොළවලට ප්‍රමාණයෙන්, හැඩයෙන් සමාන වීම හා ලා කොළ පැහැයෙන් යුතුවීම මෙයට හේතු වේ. පෝෂණීය අතින් යකඩ අධික ආහාරයක් ලෙස හැඳින්වේ. තායි කංකුන් සීඝ්‍රයෙන් වර්ධනය වන අතර දේශීය කංකුන් ප්‍රභේදයට වඩා අස්වනු ඉහළය.

මෙම ප්‍රභේදයේ අඩංගු කිරි ප්‍රමාණය ඉතා අඩු බැවින් තායි කංකුන්, දේශීය කංකුන් ප්‍රභේද මෙන් නොව අස්වැන්න නෙළාගත් විගස ආහාරයක් ලෙස පිසීමෙන් හෝ බාගෙට තම්බා පිලියෙල කරගත් ආහාරයක් ලෙස හෝ සලාද වශයෙන් පිස ගැනීමක් රහිතව භාවිතා කල හැකි වීම විශේෂ ගුණාංගයක් ලෙස හැඳින්විය හැක.

දේශීය කංකුන් ප්‍රභේද වල ඇති කිරි නිසා ඒවා අස්වැන්න නෙළූ විගස ආහාරයට ගැනීමෙන් සමහර අයට ආමාශයික ආබාධ හට ගැනීම සිදුවේ.

**ප්‍රචාරණය**

දඬු කැබලි මගින් හෝ බීජ මගින් ප්‍රචාරණය කල හැකිය. බීජ ලබා ගැනීම සඳහා වගාවේ කොටසක් වෙන්කර නඩත්තු කිරීම උචිත වේ.

**බිම් සැකසීම හා පොහොර යෙදීම**

හොඳින් ජලය බැස යන සේ උස් පාත්ති සකසාගත යුතුයි. වසර පුරා අස්වනු ලබා ගැනීම සඳහා බෝගය පිහිටුවීමට ප්‍රථම කාබනික පොහොර හා රසායනික පොහොර යෙදීම අවශ්‍ය වේ.

**අස්වනු නෙලීම**

මල් පීපීමට ඉතා ආසන්නයේදී අස්වනු නෙලීම වඩා වැදගත් වේ. මල් පිපීමෙන් පසු පත්‍ර දිගැටි රවුම් හැඩයට හැරෙන අතර වැල් ලෙස (ධාවක) වර්ධනය වේ. මෙවිට පෝෂණ ගුණාත්මය අඩුවන බැවින් පුෂ්පීකරණයට ආසන්න අවස්ථාවේ අස්වනු නෙලීම වැදගත් වේ.

ආහාරයට ගන්නා කොටස් ග්‍රෑම් 100 ක අඩංගු පෝෂණ අගයයන්

| | | |
|---|---|---|
| ශක්තිය | කි.ග්‍රෑ. | 30 |
| කැල්සියම් | මි.ග්‍රෑ. | 60 |
| විටමින් ඒ | යු.එස්.ඒකක | 6536 |
| ප්‍රෝටීන් | මි.ග්‍රෑ. | 2.7 |
| යකඩ | මි.ග්‍රෑ. | 2.5 |
| විටමින් සී | මි.ග්‍රෑ. | 45 |

**ආදායම් වියදම් සාරාංශය වර්ග මීටර් 1000 (අක්. 1/4 සඳහා)**

| ක්‍රියාකාරකම් | | දේශීය කංකුන් | තායි කංකුන් |
|---|---|---|---|
| රෝපණ ද්‍රව්‍ය | රු. | 450.00 | 450.00 |
| කාබනික හා රසායනික පොහොර | රු. | 3,750.00 | 3,750.00 |
| කෘෂි රසායන ද්‍රව්‍ය | රු. | 1,250.00 | 1,250.00 |
| කම්කරු ශ්‍රමය (දිනකට රු. 200 බැගින්) | රු. | 8,000.00 | 8,000.00 |
| වෙනත් වියදම් | රු. | 1,000.00 | 1,000.00 |
| මුළු වියදම | රු. | 14,450.00 | 14,450.00 |
| පළමු අස්වැන්න (සිටුවීමෙන් සති 6-7 කට පසු) | රු. | 16,000.00 | 20,000.00 |
| ආදායම (කි.ග්‍රෑමයක් රු. 4.00 බැගින් | කි.ග්‍රෑ. | 64,000 | 80,000 |
| පොහොර (පළමු අස්වැන්නෙන් සති 3-4 පසු) | කි.ග්‍රෑ. | 1750 | 1750 |
| කම්කරු ශ්‍රමය (දිනකට රු. 2.00 බැගින්) | රු. | 2,000.00 | 2,000.00 |
| පළමු නිරි අස්වැන්නට වියදම | රු. | 3,750.00 | 3,750.00 |
| දෙවෙනි අස්වැන්න | කි.ග්‍රෑ. | 16,000 | 22,000 |
| ආදායම (කිලෝ ග්‍රෑමයක් රු. 4.00 බැගින්) | රු. | 64,000.00 | 88,000.00 |
| පොහොර (2 වන අස්වැන්නෙන් සති 3-4 පසු) | රු. | 1,750.00 | 1,750.00 |
| ශ්‍රම වියදම (දිනකට රු. 200 බැගින්) | රු. | 2,000.00 | 2,000.00 |
| 2 වන නිරි අස්වැන්නට වියදම | රු. | 3,750.00 | 3,750.00 |
| 3 වන අස්වැන්න | කි.ග්‍රෑ. | 14,000 | 22,000 |
| ආදායම (කි.ග්‍රෑමයට රු. 4.00 බැගින්) | රු. | 54,000.00 | 88,000.00 |

## තායි කංකුන් වලින් පිළියෙල කල හැකි ආහාර

### තායි කංකුන් බැදුම

**අවශ්‍ය ද්‍රව්‍ය :**

| | |
|---|---|
| තායි කන්කුන් | ග්‍රෑම් 250 |
| ලොකු ළූණු ගෙඩි | 01 |
| මාළු මිරිස් කරල් | 3-4 |
| තක්කාලි ගෙඩි | 1 ක් හෝ තක්කාලි සෝස් |
| උම්බලකඩ හෝ වියළි ඉස්සන් | ග්‍රෑම් 50 |
| රතු මිරිස් ස්වල්පයයි | |
| කහ ස්වල්පයයි | |
| ලුණු කුඩු | |
| අබ ස්වල්පයයි | |
| මිටි කිරි | කෝප්ප 1/4 |
| තුනපහ කුඩු ස්වල්පයයි | |
| රම්පෙ, කරපිංච | |
| තෙල් ස්වල්පයක්, මාගරින් ස්වල්පයක් | |

**සාදන ක්‍රමය :**

- තායි කන්කුන් සෝදා, වතුර බේරෙන්න හැර, කෑලි වලට අතින් කඩා ගන්න.
- එයට ලුණු කුඩු, කහ, මිරිස් එකතු කර මිශ්‍ර කරන්න.
- මාළු මිරිස්, තක්කාලි, ලොකු ළූණු තරමක් ඝනකම කෑලි වලට කපා ලුණු කුඩු ස්වල්පයක් ඉසින්න.
- තෙල් මේස හැඳි 2 ට මාගරින් මේස හැඳි 2 ක් දමා රත්වන විට අබ, රම්පෙ, කරපිංච, ළූණු, මාළුමිරිස්, උම්බලබකඩ හෝ වියළි ඉස්සන් දමා මද උණුසුමේ බැදෙන්න හරින්න.
- මිරිස් ආදිය යෙදූ කංකුන් කෑබලි එයට දමා තැම්බෙන්න හරින්න. එයටම තක්කාලි ද එක්කර අවශ්‍ය නම් සීයඹලා දමන්න. මිටි කිරි දමා තැම්බුන පසු තුනපහ කුඩු එක් කරන්න.

**සැලකිය යුතුයි :**

මිටි කිරි නොදා තෙල් සහ මාගරින් වලින්ම පමණක් ද රසවත්ව බැදුම් සාදා ගත හැක.

### තායි කංකුන් මාළුව

**අවශ්‍ය ද්‍රව්‍ය :**

| | | |
|---|---|---|
| තායි කංකුන් | ග්‍රෑම් | 100 |
| අල, පරිප්පු හෝ කොස් ඇට | ග්‍රෑම් | 100 |
| කහ ස්වල්පයයි | | |
| උළු හාල්, රම්පෙ, කරපිංචා | | |
| ලියා ගත් ළූණු මේස හැඳි 2-3 | | |
| අඹරා ගත් අමු තුනපහ ස්වල්පයයි (කොත්තමල්ලි, සුදුරු, මහදුරු) | | |
| පොල් | ග්‍රෑම් | 50 |
| සුදු ළූණු බික් | 02 | |
| අබ ස්වල්පයක් | | |
| කොච්චි හෝ අමු මිරිස් කරල් කිහිපයක් | | |
| වතුර කෝප්ප | 01 | |

**සාදන ක්‍රමය :**

- තායි කංකුන් සෝදා වතුර බේරෙන්නට හැර තරමක් ලොකු කෑලි වලට කඩා ගන්න. එහි දණ්ඩ ද කෑලි වලට කඩා ගන්න.
- අල කෑලි වලට කපා හෝ පරිප්පු හෝ කොස් ඇට කෑලි කපා සෝදා පිරිසිදු කර වතුර යොදා කහ උම්බලකඩ, රම්පා, කරපිංචා, ලුනු, තැම්බෙන්න හරින්න.
- තැම්බුන පසු එයට කපාගත් තායි කංකුන් එකතු කර හොඳින් හැඳි ගා තැම්බෙන්න හරින්න.
- පොල් වලට අමු මිරිස්, අබ, සුදුළූණු, ළූණු යොදා සියුම්ව අඹරා ගන්න. අමු තුනපහ ද අඹරා වතුර ස්වල්පයක් සමග ඉහත මිශ්‍රණයට එක් කර හොඳින් තැම්බෙන විට බිමට බාන්න. මෙය අවශ්‍ය නම් තෙම්පරාදු කර ගන්න.

**සැලකිය යුතුයි :**

මෙම ව්‍යාංජනය රොටී, පාන්, තෝසේ සමග වඩා රසවත්ය.

### තායි කංකුන් මැල්ලුම

**අවශ්‍ය ද්‍රව්‍ය :**

| | | |
|---|---|---|
| තායි කංකුන් | ග්‍රෑම් | 100 |
| පොල් | ග්‍රෑම් | 50 |
| අමු මිරිස් කරල් | | 02 |
| රස පදමට ලුණු කුඩු ස්වල්පයයි | | |
| රතු ළූණු ගෙඩි 2-3 ක් සිහින්ව ලියා ගන්න | | |
| තෙල් ස්වල්පයයි | | |
| දෙහි යුෂ ස්වල්පයයි | | |

**සැකසීම :**

- කංකුන් සෝදා වතුර බේරා සිහින්ව කපන්න.
- සිහින්ව ගාන ලද පොල් වලට කපා ගත් රතු ළූණු, අමු මිරිස්, ලුණු දමා අනාගන්න. එයටම කපා ගත් කංකුන් කොළ ද මිශ්‍ර කරන්න.
- තෙල් ස්වල්පයක් ලිප තබා ඉහත මිශ්‍රණය තෙම්පරාදු කර තැම්බෙන්න හරින්න.
- මැල්ලුම බිමට බා තරමක් නිවුණු පසු දෙහි යුෂ ටිකක් එක් කර ගන්න.

## තායි කංකුන් සම්බලය

**අවශ්‍ය ද්‍රව්‍ය :**

තායි කංකුන් ග්‍රෑම් 100
පොල් ග්‍රෑම් 50
ලියාගත් රතුළූණු, අමු මිරිස්
ලුණු කුඩු
උම්බලකඩ කුඩු
දෙහි

**සැකසීම :**

- පොල් වලට ළූණු, අමු මිරිස්, උම්බලකඩ කුඩු, ලුණු සහ දෙහි යොදා හොඳින් අනාගන්න.
- ලියා ගත් කංකුන් මිශ්‍ර කර සම්බලය සාදා ගන්න.

# ආනයනික පළතුරු සෞඛ්‍යාරක්ෂිතද?

පළතුරු සහ එළවළු ආහාරයට ගැනීමෙන් නිරෝගීමත් වන බව අපි විශ්වාස කරමු. නමුත් ආනයනික පළතුරු ආහාරයට ගැනීමේදී එය බොහෝවිට සත්‍ය නොවන බව පෙනේ. එවැනි පළතුරු නිෂ්පාදනයේ සිට සිල්ලර වෙළෙන්ඳ දක්වා පැමිණීමට බොහෝ දුරක් ප්‍රවාහනය කරන අතර ඒ සඳහා දිගු කාලයක් ගතවේ. පළතුරු, ළූණු, සහ අර්තාපල් වැනි මුල් එළවළු බෝග වලට දිලීර රෝග ආසාදනය හා ප්‍රරෝහනය වැළැක්වීම වැනි කරුණු සඳහා රසායනික ඉසීම සිදුකර දිගුකාලීන ප්‍රවාහනයේ දී සිදුවන හානි වලකාලීම සිදුකරයි. මෙම රසායනික ද්‍රව්‍ය බොහොමයක් අපගේ සෞඛ්‍යයට හානිකර විෂ සහිත සංයෝග වලින් සමන්විත වේ. මෙවැනි තත්ව වලට නිරාවරණය වු පළතුරු ආහාරයට ගන්නා සැම විටම විෂ සහිත හා පිළිකා ජනක රසායනික ද්‍රව්‍ය අප අපගේ ශරීරයට ඇතුල් කරගනු ලැබේ.

මෙවැනි රසායනික බොහොමයක් අවර්ණ, ගන්ධයක් හා රසයක් නොමැති ආකාර වේ. මේවා පලතුරු හා එළවළු වලට නැවුම් පෙනුමක් ලබාදෙන බැවින් පාරිභෝගිකයා ආකර්ශනය කර ගැනීමේ හැකියාවක් සහිත නමුත් මනුෂ්‍ය ශරීරයට විනාශකාරී සංයෝග වේ. වැඩි අපනයන වටිනාකමක් සහිත පළතුරු, කන්නයට පමණක් සීමාවන පළතුරු හා ඉක්මණින් ඉදීමට හා කුණුවීමට භාජනය වන පළතුරු බොහෝ විට මෙවැනි පසු අස්වනු ප්‍රතිකාර වලට භාජනය වේ. කෘමිනාශක, දිලීර නාශක හා මී නාශක මෙවැනි ප්‍රතිකාර සඳහා බහුලව භාවිතා කරයි.

ඇපල්, පෙයාර්ස් හා අර්තාපල් ප්‍රතිකාර මගින් සති 8-16 ක් දක්වා කල් තබා ගැනේ. දෙඩම්, මිදි, ග්‍රේප්ෆෘට් සහ කිවි පළතුරු මාස 1-2 ක් දක්වාත් අලිපේර, කෙසෙල්, ප්ලම්ස් හා අඹ සති 2-4 ක් දක්වාත් තබා ගැනේ.

ක්ෂේත්‍රයේදී යොදන දිලීර නාශක වර්ෂාව, සුළඟ, අතින් අස්වනු නෙළීමේදී ඉවත්වීම සහ කැඩීමෙන් පසු සේදීම වැනි ක්‍රියාවලි වලදී බොහෝ දුරට ඉවත්වන නමුත්, පසු අස්වනු සුරැකීම සඳහා සැකසුම් මධ්‍යස්ථාන වලදී යොදනු ලබන ද්‍රව්‍ය එසේ ඉවත්විමක් සිදු නොවේ. මීට අමතරව පළතුරු වටා ඉසිනු ලබන ඉටි ආවරණය මගින් එවා වඩාත් සුරක්ෂිත වීම සිදුවේ.

**පළතුරු පිරිසිදු කිරීම**

හොඳින් සෝදන්න. ජලයෙන් සේදීමෙන් 50% ක් පමණ රසායනික ඉවත්වන අතර ලෙල්ල ඉවත් කිරීමෙන් අනෙක් 50% ඉවත් කිරීමට හැකි වේ. කෙසේ නමුත් සමහර රසායනික සංයෝග මාංශලය තුළට ගමන් කරන බැවින් එවැනි සංයෝග ඉවත් කිරීම අපහසු වේ.

**රසායනික සහිත පලතුරු සේදීමේ ඵලදායී ක්‍රම**

- සෝඩියම් බයිකාබොනේට් තේ හැන්දක් ජලය ලීටර 20 ක දියකර, පළතුරු එහි විනාඩි 15 ක් ගිල්වා තබන්න. ඊළඟට එවා පිරිසිදු වතුරෙන් සෝදන්න. මේ මගින් එලාවරණය මතුපිට තැන්පත් වු රසායනික වලින් 95% ක් පමණ ඉවත්වන නමුත් විටමින් ' යම් ප්‍රමාණයකට සේදීමත් සමග ඉවත් විය හැක.
- පළතුරු විනාඩි 2 ක් පමණ අතුල්ලමින් ගලන ජලයෙන් සෝදා හරින්න. මේ මගින් 63% ක් පමණ ඉවත් කළ හැකි වේ.
- වතුරෙන් සෝදා හැර ඉන්පසුව ප්‍රමාණවත් ජලය ප්‍රමාණයක විනාඩි 15 ක් ගිල්වා තැබීමෙන් රසායනික තැන්පත් 7-53% ක් පමණ ඉවත් වේ.
- විනාකිරි මිශ්‍රිත ජලයේ මිදී ගිල්වා තැබීමෙන් වැඩි රසායනික තැන්පත් ප්‍රමාණයක් ඉවත් කල හැකිවේ. නමුත් රසායනික මගින් ආසාදිත මාංශලය පිරිසිදු කළ නොහැක.
- පළතුරු ශීතකරණ තුළ ගබඩා කිරීම රසායනික සංයෝග අඩු කිරීමට හේතු වේ. උදහරණයක් ලෙස මිදි ශිතකරණයක් තුළ දින 7 ක් තැබීමෙන් තැන්පත් වු රසායනික සංයෝග වලින් 65% පමණ අඩුකරගත හැකි වේ.
- පාරිභෝජනය සඳහා සුදුසු පළතුරු තෝරා ගැනීම වැදගත් වේ. සම්පූර්ණ ගෙඩියම කහපාට වු අඹ, වායු මගින් ධුමාකරණය නිසා ඇති වු පෙනුමක් විය හැකිය. ස්වාභාවිකව ඉදුනු අඹ ගෙඩියේ පොත්තෙහි කොළ පැහැති කොටස් දැකිය හැකිය. මේ නිසා පළතුරු මිල දී ගැනීමේදී ස්වාභාවික පෙනුම සහිත ඵල තෝරා ගැනිම වැදගත් වේ.

මූලාශ්‍රය : *Agro – chemicals News in Brief, vol. xxIII, N0. 2 April – June 2000*




ඇඹුල් කෙසෙල් ප්‍රභේදයේ ගෙඩි තුළ පණුවන් සිටින බව 1999 පෙබරවාරි මස පර්යේෂණ ආයතනය වෙත වාර්තා විය.

පසුව දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් ප්‍රධාන වශයෙන් කෑගල්ල, මහනුවර, මාතලේ, ගම්පහ, අලව්ව, කුරුණෑගල හා කොළඹට තදාසන්න ප්‍රදේශ වලින් බහුල ලෙස හානිය වාර්තා වූ බැවින්, පළමුව මේ පිළිබඳව සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල වුයේ :

- මෙය පළතුරු මැස්සාගේ (බැක්ටොසෙරා විශේෂ) හානිය නිසා ඇති වූ ප්‍රතිඵලයක් බවයි.
- සියළුම ප්‍රභේද වලට හානි කරන අතර ඇඹුල් වලට හානිය බහුල විය.
- වැඩි ජනගහනය හේතුවෙන් කෙසෙල් පාරිභෝජනය ප්‍රධාන ලෙස කොළඹ, ගම්පහ, ප්‍රදේශ වලට කේන්ද්‍ර වන බැවින් එම ප්‍රදේශ වල හානිය බහුල විය.
- තවද හානි වූ ගෙඩි විසි කිරීම හා කුණුවීමට හැරීම මගින් පළතුරු මැස්සාගේ ජීවන චක්‍රය සම්පූර්ණවීමට එය පූර්ණ පිටිවහලක් වූ අතර එය තව දුරටත් මැස්සාගේ ගහනය ව්‍යාප්ත වීමට හේතු වී ඇති බව.

එම කන්නයේ මෙම සතුන්ගේ ප්‍රධාන ධාරක පළතුරු වර්ගය වන අඹ අස්වැන්න අඩුවීමත්, කෙසෙල් වගාව වැඩි වශයෙන් ව්‍යාප්ත වීම හා අස්වනු වැඩිවීම යන හේතුවෙන් මෙම මැස්සන් කෙසෙල් ගෙඩි වලට හානි කිරීමට පෙළඹෙන්නට ඇතැයි අනුමාන කළ හැක. 1980 ගණන් වලදී මෙම හානිය ලංකාවේ ප්‍රථම වරට වාර්තා වී ඇති අතර පසුව දිවයිනේ විවිධ තැන් වලින් වරින් වර වාර්තා වූ නමුත් ගැටළුවක් ලෙස වර්ධනය වුයේ නැත.

කෙසෙල් වගාවේ තාක්ෂණ ශිල්පීය ක්‍රම හා උසස් පාලන ක්‍රම අනුගමනය කෙරෙන උඩවලව, හම්බන්තොට හා රත්නපුර යන ප්‍රදේශවලින් මෙම හානිය වාර්තා වුයේ සුළු වශයෙනි. මෙම ප්‍රදේශ වල කෙසෙල් කැන් කහ පැහැයට හැරෙන තුරු අස්වනු නෙලීමට ප්‍රමාද නොකිරීම මෙයට හේතුවක් ලෙස හැඳින්විය හැක.

ක්ෂේත්‍රයේදී ලබාගත් සාම්පල වලින් පර්යේෂණාගාරයේ දී මේ පිළිබඳව පර්යේෂණ කිහිපයක් පවත්වන ලදී. ඒ අනුව ලද නිගමන

- පළතුරු මැස්සාගේ විශේෂ අතුරින් බැක්ටොසෙරා කැන්ඩියෙන්ඩිස් හා බැක්ටොසෙරා ඩෝසාලිස් යන විශේෂ මෙම හානිය සිදු කරන අතර බහුල වශයෙන් දක්නට ලැබුන විශේෂය වුයේ බැක්ටොසෙරා කැන්ඩියෙන්ඩිස් බවත් හඳුනා ගන්නා ලදී.
- සෑම ප්‍රභේදයකටම හානි කරන අතර ඇඹුල් ප්‍රභේදය වඩාත් බහුල නිසා එම ප්‍රභේදයට හානිය වැඩි වශයෙන් පෙන්නුම් කරන බවත්ය.
- නමුත් අනෙකුත් ප්‍රභේද වලට ද පොදුවේ හානි කරන බව දක්නට ලැබුණි.
- මෙම පළතුරු මැස්සන් විශේෂ පොදුවේ බොහොමයක් පළතුරු වර්ග වලට හානි සිදු කරයි.
- කෙසෙල් ගෙඩි හොඳින් මෝරා පොත්ත තුනී වන විට මෙම මැස්සන් බිත්තර දැමීම ප්‍රිය කරයි.
- ගැහැණු සතාගේ ඩිම්භ නිධායකය ආධාරයෙන් කෙසෙල් ගෙඩියේ පොත්තට යටින් බිත්තර තැන්පත් කරයි.
- එක් ගැහැණු සතෙකු දිනකට බිත්තර 138 - 140 ක් පමණ බිත්තර සංඛ්‍යාවක් පමණ දමන අතර මෙය නොකඩවා දින 25 ක් පමණ සිදු කරයි.
- බිත්තර පුපුරා පිටවන කීටයන් මාංසලය කොටස ආහාරයට ගනී. කිට අවස්ථාව අතුරණු 3 ක් දක්නට ලැබෙන අතර තුන්වෙනි අතුරනුයේ කීටයන් පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවේ. මෙම හානිය සිදුකල ගෙඩි පිටතින් හඳුනා ගැනීම අපහසුමුත් ගෙඩි මතුපිටින් ඇල්ලීමේදී එම ස්ථාන මෘදු බවක් දක්නට ලැබේ.

**පාලන ක්‍රම**

- කෙසෙල් කැන් සඳහා නිල් පොලිතීන් ආවරණය යෙදීම.
- කෙසෙල් ගෙඩි මේරීමට පෙර කැන් ආවරණය කිරීම (ඇඹුල් කෙසෙල් ප්‍රභේදයේ නම් දින 75 කට පෙර)
- කැන ඉදෙන තෙක් ක්ෂේත්‍රයේ තබා නොගැනීම.
- වෙළෙඳසැල් වල අලෙවියට තබා ඇති කෙසෙල් කැන් විනිවිද පෙනෙන පොලිතින් කවරයකින් හෝ ඉතා සියුම් සිදුරු සහිත දැල් වලින් ආවරණය කිරීම.
- වෙළෙඳපොල වල්, පළතුරු ගබඩා, තොග හා සිල්ලර වෙළඳ මධ්‍යස්ථාන වල ඉවත දමන කෙසෙල් ගෙඩි, කෙසෙල් ලෙලි මෙන්ම අනෙකුත් ඉවතලන පළතුරු විනාශ කිරීම, බොහෝ ගැඹුරට වලක් කපා වළලා දැමීම, ස්ථානය අවට පිරිසිදුව පවත්වා ගැනීම.
- පෙරමොන් (මීතයිල් ඉයුජිනෝල්) උගුල් භාවිතය, මෙහිදී පිරිමි සුහුඹුලන් උගුලට අසුවී විනාශ වී යයි. මේ මගින් පිරිමි සතුන්ගේ ගහනය අඩු කර ගත හැක. නමුත් ගැහැණු සතුන් මෙයට ආකර්ෂණය වන්නේ නැත.

*මූලාශ්‍රය : **ආචාර්ය රෝහිණී ඒකනායක මිය පර්යේෂණ නිළධාරිණී විසින්** ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ පැවැත්වූ දේශණයක් ඇසුරින් සකසන ලදී.*

*සංස්කරණය*
**පී. වාසුදේවා**

*පරිවර්තනය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

# රා.සේ.පි.

**මුද්‍රිත ද්‍රව්‍යය**

**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.